Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අනාවරණ පරීක්ෂණය 2021

# බුද්ධ ධර්මය

**8 ශ්‍රේණිය** **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි

- **I** කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු දෙකක් හිමිවේ. මුළු ලකුණු 40 කි.
- **II** කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

## I - කොටස

- **ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල නිවැරදිම පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 යහපත් සමාජ ධර්මතා ඇතුළත් සූත්‍ර දේශනාවක් වන්නේ,

(i) කරණීයමෙත්ත සූත්‍රයයි. (ii) සිඟාලෝවාද සූත්‍රයයි.

(iii) මහා මංගල සූත්‍රයයි. (iv) වසල සූත්‍රයයි.

02 කාව්‍ය ශේඛරය රචනා කරන ලද්දේ,

(i) තොටගමුවේ සිරි රහල් හිමියන් විසිනි. (ii) වැත්තෑවේ හිමියන් විසිනි.

(iii) එස්. මහින්ද හිමියන් විසිනි. (iv) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමියන් විසිනි.

03 සිදුහත් බෝසතාණන් වහන්සේගේ උපාය කුසලතාවය පිළිඹිබු වන ජාතක කථාවක් වන්නේ,

(i) වෙස්සන්තර ජාතක කථාවයි. (ii) සාම ජාතක කථාවයි.

(iii) උම්මග්ග ජාතක කථාවයි. (iv) වණ්ණුපථ ජාතක කථාවයි.

04 මහා මංගල සූත්‍රයේ සඳහන් මංගල කරුණු ගණන,

(i) තිස් අටකි. (ii) තිස් හයකි. (iii) තිස් දෙකකි. (iv) තිස් හතරකි.

05 බුදුගුණ මෙනෙහි කරමින් වඩන භාවනාව

(i) මෛත්‍රී භාවනාවයි. (ii) පිළිකුල් භාවනාවයි.

(iii) ආනාපානසති භාවනාවයි. (iv) බුද්ධානුස්සති භාවනාවයි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

(ධර්මය හා විනය / නිත්‍ය ශීලය / මුගලන් තෙරුන් / අත්ථි සුඛය / ත්‍රිවිධ මංගල්‍යය)

06 බෞද්ධ ගිහියාගේ පංච ශීලය ........................................................................................ ලෙස ද හඳුන්වනු ලබයි.

07 ආනන්ද මාහිමියන් අමතා බුදුන් වහන්සේ දේශනා කළේ තමන් වහන්සේගේ ඇවෑමෙන් පසුව ............................................................................ ශාස්තෲත්වයට පත්වන බවයි.

08 උත්සහය, වීර්ය, දැතේ සවිය මෙන්ම ධාර්මිකව ඉපයූ ධනයක් තමන් සතුව ඇතැයි යන සොම්නසින් සතුටු විය හැක්කේ ...................................................................... යෙනි.

09 ...................................................................... තෙරුන් විසින් නන්දෝපනන්ද නාගරාජයා දමනය කළ සේක.

10 දළදා වහන්සේ උදෙසා සිදු කරනු ලබන වාර්ෂික පුද පූජාවලට අයත් නොවන්නේ .......................................................................... මංගල්‍යයයි.

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් හරි ලකුණ ද (✓) වැරදි නම් වැරදි (✗) ලකුණ ද ඉදිරියෙන් දී ඇති වරහන තුළ යොදන්න.**

11 නිවැරදි දැකීම හෙවත් යහපත් අවබෝධය සම්මා දිට්ඨි යනුවෙන් බුදු දහමේ හැඳින්වේ. ( )

12 සිවුරු ඇඳීම, පෙරවීම හා ගමන බිමන පිළිබඳ පනවා ඇති ශික්ෂා පද සේඛියා ශික්ෂා පදයි. ( )

13 මුදිතාව යනුවෙන් හඳුන්වන්නේ මිතුරුකමයි. ( )

14 බුදුරජාණන් වහන්සේ බරණැස ඉසිපතන මිගදායේ දී මංගල ධර්ම දේශනාව පැවැත් වූ සේක. ( )

15 ධම්ම පදය බෞද්ධ ජනයාගේ හස්තසාර ග්‍රන්ථයක් ලෙස නොපිළිගනී. ( )

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රකාශය සම්පූර්ණ කිරීමට සුදුසු වඩාත් නිවැරදි පිළිතුර B තීරුවෙන් තෝරා එහි අංකය A තීරුවේ තිබෙන වරහනෙහි යොදන්න.**

| | A තීරුව | | | B තීරුව |
|---|---|---|---|---|
| 16 | දෙව්දත් තෙරුන් සමග බුදුරජාණන් වහන්සේට විවිධ හිංසා පීඩා කිරීමට පෙළඹුනේ | ( ) | 1. | කාම තණ්හා |
| 17 | පංච ඉන්ද්‍රියන් පිනවීමට ඇති කැමැත්ත හඳුන්වන්නේ | ( ) | 2. | දේවදත්ත හිමි |
| 18 | ධාර්මිකව උපයාගත් ධනය භුක්ති විඳීම, පින් දහම් කිරීම යන්නෙන් ලබන සතුට | ( ) | 3. | අජාසත්ත රජු |
| 19 | ඇවැත්නි ශෝක නොවන්න නොවැලපෙන්න ඒ මහා ශ්‍රමණයා අපෙන් මිදුණෝ වෙමු. යන ප්‍රකාශය කළේ | ( ) | 4. | භෝග සුඛය |
| 20 | පංචවර යාචනය ඉදිරිපත් කළේ | ( ) | 5. | සුභද්‍ර භික්ෂුව |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 (i) පසේනදී කොසොල් රජතුමාගේ අග බිසවගේ නම කුමක් ද?

(ii) සිතින් සිදුවන කුසලකර්ම 2 ක් ලියන්න.

(iii) බුද්ධත්වය ලැබීමෙන් පසු ප්‍රථමයෙන්ම දේශනා කළ සූත්‍රය කුමක් ද?

(iv) දුකට මුල්වන ත්‍රිවිධ තණ්හාවෙන් දෙකක් නම් කරන්න.

(v) මියුළු නුවර වෛදේහ රජුට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කළ පඬිවරු 4 දෙනාගෙන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

(vi) සතර සංග්‍රහ වස්තු වලින් 2 ක් නම් කරන්න.

(vii) අටවැදෑරුම් දුක්වලින් දෙකක් සඳහන් කරන්න.

(viii) බුදුරජාණන් වහන්සේ ආහාර ගැනීම සම්බන්ධයෙන් පනවා ඇති සේඛියා ශික්ෂා පද 2 ක් ලියන්න.

(ix) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය හා බැඳී ක්‍රියා කළ අවස්ථා දෙකක් නම් කරන්න.

(x) බුදු දහම සිය ජීවන පැවැත්මට යොදාගැනීමෙන් ඇතිවූ උසස් මානව ගුණාංග වලින් දෙකක් සඳහන් කරන්න.

02 (i) සිගාලක ගෘහපතියාට දේශනා කළ සූත්‍රය කුමක් ද?

(ii) එම සූත්‍රයට අනුව අඹුසැමි සබඳතාවයේ ස්වාමියාගෙන් බිරිඳට ඉටුවිය යුතු යුතුකම් 3 ක් ලියන්න.

(iii) ''තම ඉගෙනීමේ කටයුතු සාර්ථක කරගත හැක්කේ යහපත් මිතුරු ඇසුරක් පවත්වා ගැනීමෙන් ය.'' මේ පිළිබඳව ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.

03 (i) ප්‍රථම ධර්ම සංගායනාවට මූලිකත්වය හා අනුග්‍රහකත්වය ලබාදුන් දෙදෙනා නම් කරන්න.

(ii) එම ධර්ම සංගායනාව පැවැත්වූ ස්ථානය පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

(iii) ඔබ විසින් පංති කාමරය තුළදී ඇතිකර ගන්නා ආරවුලක් විසඳා ගැනීමට ක්‍රියා කරන ආකාරය පැහැදිලි කරන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

04 (i) යස්ස පාපං කතං කම්මං - කුසලේන පිහියති ..... යන ගාථා පාඨය සම්පූර්ණ කරන්න.

(ii) එම ගාථා පාඨයේ සරල අදහස ලියන්න.

(iii) ශිෂ්‍ය ජීවිතය ආලෝකමත් කර ගැනීමට මෙම ගාථාව කෙතෙක් දුරට ඉවහල් වන්නේදැයි කෙටියෙන් පෙන්වා දෙන්න.

05 (i) දුක්ඛ සත්‍යය තුන් ආකාර වේ. ඉන් දෙකක් නම් කරන්න.

(ii) සත්ත්වයාගේ මරණය සිදුවන ප්‍රධාන ආකාර 4 කි. ඉන් 3 ක් සඳහන් කරන්න.

(iii) අන් අයගේ දුකේදී ඔවුන්ට උපකාර කිරීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.

06 (i) සප්ත අපරිහානි ධර්මවලට අනුව කටයුතු කළ රාජ්‍යය කුමක් ද?

(ii) සප්ත අපරිහානී ධර්මවලින් තුනක් නම් කරන්න.

(iii) ''නීතිගරුකව කටයුතු කිරීම'' සමාජයක දියුණුවට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

07 පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් සපයන්න.

(i) උපතිස්ස

(ii) චුල්ලපන්ථක

(iii) දළදා වහන්සේ

(iv) මෙත්තා ගුණය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

(01) ii (02) i (03) iii (04) i (05) iv (06) නිත්‍ය සීලය
(07) ධර්මය හා විනය (08) අක්ෂි සුඛය (09) මුගලන් (10) ත්‍රිවිධ මංගල්‍යය
(11) ✓ (12) ✓ (13) × (14) ✓ (15) × (16) අජාසත්ත රජතුමා (17) කාම තණ්හා
(18) භෝග සුඛය (19) සුභද්‍ර (20) දේවදත්ත

(ලකුණු = 40)

## II - කොටස

01 (i) මල්ලිකා දේවිය

(ii) දැඩි ලෝභයෙන් වැළකී පරිත්‍යාගශීලී වීම, ද්වේශයෙන් වැළකී මෛත්‍රියෙන් යුක්ත වීම, වැරදි දෘෂ්ටියෙන් මිදී නිවැරදි දෘෂ්ටිය අත්කර ගැනීම.

(iii) දම්සක් පැවතුම් / ධම්මචක්කප්පවත්වන සූත්‍රය

(iv) කාම තණ්හා / භව තණ්හා / විභව තණ්හා

(v) සේනක, ප්‍රකීකුස, කාවින්ද, දේවින්ද

(vi) දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාවය

(vii) ඉපදීම / වයස්ගත වීම / ලෙඩවීම / මරණය / අප්‍රියයන් හා එක්වීම / ප්‍රියයන්ගෙන් වෙන්වීම / කැමතිදේ නොලැබීම / පංච උපාදානස්කන්ධය

(viii) අත ගසාදමමින් නොවැළඳීම, ආහාර මුඛය තුළ තිබියදී කථා නොකිරීම, ආහාර මුව තුළට විසි නොකිරීම, තලු ගසමින් නොවැළඳීම (පෙළ පොතේ පිටු අංක 56-57)

(ix) ඉපදීම, බුදුවීම, මංගල ධර්ම දේශනාව, පිරිනිවන් පෑම

(x) ඉවසීම, කරුණාව, මෛත්‍රිය, අන්‍යයන්ට ගරු කිරීම, දෙමව්පියන්ට හා වැඩිහිටියන්ට සැලකීම, පරිත්‍යාගශීලී බව, යහපත් දක්ම

02 (i) සිඟාලෝවාද සූත්‍රය

(ii) සම්මාන කිරීම, අවමන් නොකිරීම, වෙනත් කාන්තාවන් කරා නොයෑම, වගකීම් පවරාදීම, ඇඳුම් පැළඳුම් ලබාදීම.

(iii) පිටුව 74/75 පිටුවට අදාළව ලියා ඇති පිළිතුරේ සමස්ථය ගැන සිතා ලකුණු ප්‍රදානය කරන්න.

03 (i) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ / අජාසත්ත රජතුමා

(ii) රජගහනුවර වේදහාර පර්වත ප්‍රාන්තයේ සප්ත පර්ණී ගල් ගුහාව අසල සකස් කරන ලද අලංකාර මණ්ඩපයක

(iii) ලියා ඇති පිළිතුරේ නිරවද්‍යතාවය හා ප්‍රශ්නයට ගැළපෙන ආකාරය පිළිබඳව සැලකිලිමත්ව ලකුණු ප්‍රධානය කරන්න.

04 (i) යස්ස පාපං කතං කම්මං - කුසලේන පිථීයති
සෝ ඉමං ලෝකං පභාසේති - අබ්භා මුත්තෝව චන්දිමා

(ii) යමෙක් පසක් කරන ලද පාප කර්මය ඔහු විසින් කරන ලද කුසල කර්මයෙන් වැසී යයි ද එය වළාගැබින් මිදුණු පුන්සඳ මෙන් බබලන්නේ ය.

(iii) ගාථාව හා සම්බන්ධව ලියා ඇති පිළිතුරේ සමස්ථය ගැන සැලකිලිමත්ව ලකුණු ප්‍රදානය කරන්න.

05 (i) දුඃඛ දුඃඛතා / විපරිනාම දුඃඛ / සංස්කාර දුඃඛ

(ii) ආයුෂ ගෙවීයාම / කර්ම ශක්තිය අවසන් වීම / ආයුෂත් කර්මත් යන දෙකම අවසන් වීම / ආයුෂ හා කර්ම ශක්තිය යන දෙකම ඉතිරිව තිබියදී හදිසි අනතුරුවලින් හානි වීම. (ආයුඛය / කම්මඛය / උභයක්ඛය / උපච්ඡේදක)

(iii) ශිෂ්‍යයා විසින් ලියා ඇති පිළිතුරේ සමස්ථය ගැන සැලකිලිමත්ව ලකුණු ප්‍රධානය කරන්න.

06 (i) වජ්ජි රාජ්‍යය

(ii)
* නිතර රැස්වීම / සමගිව රැස්ව සමගිව කටයුතු කර සමගිව විසිර යාම.
* නොපැනවූ නීති නොපැනවීම හා පැන වූ නීති කඩනොකර ආරක්ෂා කිරීම.
* වැඩිහිටි උපදෙස් පිළිපැදීම හා ඔවුන්ට ගරු කිරීම.
* විවාහක කුල කාන්තාවන්ගේ හා අවිවාහක කුල කුමරියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම.
* පූජනීය ස්ථාන රැක ගැනීම, ගෞරව කිරීම, නඩත්තු කිරීම.
* පූජ්‍ය උතුමන්ට ගරු කිරීම.

(iii) ශිෂ්‍යා ලියා ඇති පිළිතුරේ නිරවද්‍යතාවය ගැන සිතා ලකුණු ලබාදෙන්න.

07 (i), (ii), (iii), (iv) ප්‍රශ්නවලට ශිෂ්‍යයා ලියා ඇති පිළිතුරුවල දක්නට ලැබෙන විෂය කරුණු හා ලිවීමේ කුසලතාවය මත පදනම්ව අවශ්‍ය පරිදි ලකුණු ප්‍රධානය කරන්න.